ළදරු මනස හඳුනා ගැනීම

# දරුවන්ට ගෙදරත් පෙර පාසලක්



මහරගම ජාතික අධ්‍යාපන ආයතනයේ ප්‍රාථමික ගණිත ඒකකයේ උපදේශිකා

**අමරා අමරසිංහ**

**පවුලකට සම්පතක්, රටට සම්පතක් වන දරුපරපුර පිළිබඳව වත්මන් සමාජයේ පවත්නා එක්තරා ගැටළුවකි, මව රැකියාවට යාම නිසා දරුවන්ගේ ඉදිරිගමන පිළිබඳ ප්‍රශ්නය. ඕනෑම මවක්, පියකු සිතන්නේ තමන්ගේ දරුවා උගතෙකු, දැනුමැත්තෙකු කිරීමට ය. සමාජයේ ඉහළම තලයට ගෙනයාමට ය. එනිසාම දෝ ඉතා බාල බොළඳවියේදීම තම දරුවන් පෙර පාසල් යවන මව්වරුන් අද සමාජයේ කොතෙකුත් දක්නට ලැබේ.**


එහෙත් කර්මාන්තශාලාවකට දනවා වගේ දරුවන් මොන්ටිසෝරියකට යවන මේ අම්මලා දන්නේ නැතුව ඇති දරුවා ඉගෙනුම ලබන්නේ මව්කුස සිටියදීම බව. ඒ විතරක් නොවේ දරුවාගේ පෙර පාසල ඇත්තේ ගෙදරම බව නොසිතනවා විය හැකිය. උපතේදී සිටම දරුවා පෙනී, නොපෙනී වගේ ඉගෙනගන්නාබව රහසක් නොවේ. මව් කුස සිටින දරුවාට මාස හතක් පමණ වන විට ඔහුගේ පංචේන්ද්‍රියන් ක්‍රියා කිරීමට පටන් ගනී. මේ කාලයේ මව සතුටින් සිටින විට දරුවා ද සතුටින් සිටියි. මව කරදර කම්කටොළුවලට මැදිව, කණස්සල්ලෙන් සිටී නම් එය ද දරුවාට බලපායි. දරුවකු පිළිසිඳගත් පසු මව, ප්‍රිය වචන ඇසිය යුතු බව, සැහැල්ලුවෙන් විනෝදයෙන් කාලය ගත කළ යුතු බව වෛද්‍යවරුන් පවසන්නේ එනිසාවෙනි. "දරුවා ඉපදුණු මොහොතේ මවගේ මුල්ම කිරි ටික එන, එනම් කොලොස්ට්‍රම්, කහපාට කිරි නොවරදවාම දරුවාට දිය යුතුය. දරුවා ලෙඩරෝග වලින් ආරක්ෂාවීමට මෙය අවශ්‍යයි. ඇත්තවශයෙන්ම මෙය රත්කිරකි. අපේ පැරණි චාරිත්‍රයක් තියෙනවා මවගේ කිරි ටිකක් දෙවා එයට රත්‍රන් මුද්දක් හෝ රන් ආභරණයක් ගලගා රත්කිරි කට ගානවාය කියා එම කිරි දරුවාට පෙවීම. එහෙත් රත්කිරි නම් මවගේ මුල්ම කහපාට කිරයි. දරුවාට කිරි පොවන විට මව දරුවාගේ ඇස්දෙක දෙසම බලා ගෙන කිරිදිය යුතුයි. දරුවා ඉලක්කයට බලන්න ඉගෙන ගන්නේ එවිටයි.

**දරුවාට මාස 4 ක් හෝ 6 ක් යන තුරු ඔහුගේ වැඩීම පිළිබඳව නිරීක්ෂණය කළ යුතුයි. දරුවාගේ මේරීමට අනුවයි ඔහුට උත්තේජනය ලබා දිය යුත්තේ. යමක් අතට අල්ලනවාද ? යමක් දිහා බලාගෙන ඉන්නවද ? යනාදීන් නිතර නිරීක්ෂණය කළ යුතුයි. මේ කාලයේ දී ගෙන් ගෙට යන පවුල් සෞඛ්‍ය සේවිකාවගේ සහයෝගය ලබා ගත යුතුයි.**






දරුවාගේ මුල්ම සම්බන්ධය ගොඩනැගෙන්නේ අම්මා සමගයි. දරුවා තුරුලු කරගැනීමෙන්, සිප ගැනීමෙන් දරුවාගේ ඉන්ද්‍රියන්ට දැනීම ඇති වෙනවා. දරුවාට ආදර වචන කතා කිරීම – අවශ්‍යමයි. දරුවාට මාස 4 ක් හෝ 6 ක් යන තුරු ඔහුගේ වැඩීම පිළිබඳව නිරීක්ෂණය කළ යුතුයි. දරුවාගේ මේරීමට අනුවයි ඔහුට උත්තේජනය ලබා දිය යුත්තේ. යමක් අතට අල්ලනවාද ? යමක් දිහා බලාගෙන ඉන්නවද ? සංගීතයට සවන් දෙනවාද? යනාදීන් නිතර නිරීක්ෂණය කළ යුතුයි. මේ කාලයේ දී ගෙන් ගෙට යන පවුල් සෞඛ්‍ය සේවිකාවගේ සහයෝගය ලබා ගත යුතුයි. ඒ ළමා සංවර්ධනයෙහිලා අලුත් අලුත් දැනුම ඔවුන් ළඟ ඇති හෙයිනි. දරුවාගේ ඇහැට උත්තේජනය ලැබීම සඳහා චලනය වෙන දේවල් දරුවාට පෙනෙන්නට සැලැස්විය යුතුයි.









අපේ කාලෙ අම්මලා කුරුලු කොට්ට සාද ඇඳ ඉහ ඉස්සරහ එල්ලුවේ එනිසායි. අද කාලෙ නම් කැරකෙන කුඩු වැනි දේවල් වෙළෙඳපොළෙන් මිලදී ගන්න පුළුවන්.

" දරුවා මුලින්ම හොඳනරක ඉගෙනගන්නේ ගෙදරින්. බුදුන්වහන්සේ කියූ පරිදි මව්පියන් තමයි පූර්ව ආචාර්යවරුන්. දරුවාට ජීවත්වීමට අවශ්‍යවන හැකියාවලින් සියයට පණහකට වැඩි කොටසක් ප්‍රාථමික අවධියෙදි ලැබෙන්නෙ අම්මා තාත්තා දෙපළගෙන්. ඒ නිසා මේ කාලෙදි ඉගෙනුම් අවස්ථා මඟ හැරුණොත් එය දරුවාගෙන් සදහටම ඈත්වෙන්නත් පුළුවන්.

ප්‍රාථමික අවදියෙ දි ඇහෙනව ඇති. අහගන්න ඉගෙන ගන්නව. පෙනෙනව ඇති. එහෙත් බලාගන්න ඉගෙන ගන්නව. උපතේසිටම දිගටම රසවල් දැනෙනව ඇති. ඒවා වෙන්වෙන් වශයෙන් හඳුනාගන්න ඉගෙන ගන්නවා ඇති. කිරි රස, පැණි රස, අඹ රස, ඇඹුල් රස, යනාදී වශයෙන් දරුවාට ආහාරයට දෙන දේවලින් විවිධ රස වර්ග හඳුනා ගනී.

**දරුවා මුලින්ම හොඳනරක ඉගෙනගන්නේ ගෙදරින්. බුදුන්වහන්සේ කියූ පරිදි මව්පියන් තමයි පූර්ව ආචාර්යවරුන්. දරුවාට ජීවත්වීමට අවශ්‍යවන හැකියාවලින් සියයට පණහකට වැඩි කොටසක් ප්‍රාථමික අවධියෙදි ලැබෙන්නෙ අම්මා තාත්තා දෙපළගෙන්. ඒ නිසා මේ කාලෙදි ඉගෙනුම් අවස්ථා මඟ හැරුණොත් එය දරුවාගෙන් සදහටම ඈත්වෙන්නත් පුළුවන්.**

දරුවාගේ පංචේන්ද්‍රියයන්ට දැනෙන දේ වචනවලට පරිවර්තනය වුණොත් පමණයි ඒවා මතසේ රැඳෙන්නෙ. ඇසෙත් යමක් දැක්කොත් ඒකට වචනයක් තියෙනව. මේ දකින්නෙ අම්මා තාත්තා, වතුර, කිරි, යනාදී වශයෙන් ඒ වචන හඳුනා ගනීවි. කණට යමක් ඇසුණොත් ඒකට නමක් හඳුනා ගනීවි. බස් එකේ ශබ්දය, කාක්කෙක්ගෙ නාදය, යනාදී වශයෙන් . පරිසරයේ ශබ්ද හඳුනා ගනීවි. මේ දේවල් දරුවා නැවත මතක් කර ගන්නේ වචනවලින්. ඒ නිසා මේ අත්දැකීම්වලට වචනයක් දෙන්න පුළුවන් වැඩිහිටියන්ට. එවිට දරුවාගේ වාග්මාලාව පෝෂණය වෙනවා. දරුවා කතා කරන්න පටන්ගත් විට අර වචන ගලාගෙන එනවා. ඒ වෙලාවට වැඩිහිටියෝ කියනවා මේ ළමයහරි පැහිච්ච ළමයෙක්, කියලා. ඒ කියන්නෙ සමච්චලේට. එහෙත් ඒක අගය කළ යුතු දෙයක්. වැඩිහිටියෝ කියල ළමයට ඇහිල තිබුණු වචන තමයි ළමයා පිටකරන්නෙ. ඒ නිසා සමාජයේ නරක යයි කියන වචන වැඩිහිටියෝ දරුවා ඉදිරියේ කියන්න හොඳ නෑ. වචන, වාක්‍ය රටාව සියල්ලම ළමයා ඉගෙන ගන්නෙ ගෙදරින්. පෙර පාසලට යන්නට පෙර ඒ නිසා වැඩිහිටියෝ නිතරම ළමයා එක්ක කතා කරන්න ඕනෙ. බහතෝරන වියේ දි ළමයට කතා කරන්න ඉඩ දෙන්න ඕනෙ. ඒ වෙලාවෙදි ළමයට වචන උච්චාරණය හරියට වෙන්නෙ නෑ. එහෙත් වැඩිහිටියෝ ළමයට හරි දේ කියාදෙන්න ඕනෙ.ළමයා ජෝ - කියනව වතුරට - බව්වා කියනවා බල්ලට. මේවාට බිරි වචන කියා දෙන්න ඕනෙ. එපමණක් නොවෙයි අපිට ආවේනිකවූ නෑකම් තියෙනවා. අම්මට අම්මා කියනවා මිස, අම්මී, තාත්තට , තාත්ති, නැන්දට නැන්දි, පුංචි අම්මාට, පුංචි, මේවගේ වැරදි විදිහට නෑකම් කියාදීම හොඳ නෑ. ළමයට හරි දේම කියා දිය යුතුයි. එය වැඩිහිටියන්ගේ යුතුකම.

අපේම කියා සංස්කෘතියක්, තියෙන නිසා අපේ කම කියා පාන නැලවිලි ගී අප සතුව තියෙනවා. අපේ දරු නැලවිලි ගීවලින් වීරත්වයක් ගෙන දෙන ඒවා අපට තිබුණා.

"ඔන්න බබෝ
ඇතින්නියා
ගල් අරඹේ
සිටින්නියා
ගලින් ගලට
පනින්නියා
බබුට බයේ
දුවන්නි යා

" නෑ සබඳකම් තහවුරුවන ගීත ද ඒ අතර තිබුනා "

" පුතේ උඹේ ලොකු අම්මා අතේ වළල්ලක් දැම්මා
නැතේ අගය එහි නිම්මා
පුතේ නාඩ දොයියම්මා"

ගමේ දේවල්, පලතුරු පලා කෑම අගය කළ ගීත ද ඒ අතරම තිබුණා."

"අතට වෙරළු ඇහිද ගෙනේ ඉනට පලා
නෙලා ගෙනේ බරටම දර කඩා ගෙනේ එයි
අම්මා විගසකිනේ "

මේ ගීත ඇහෙන විට ළමයාගේ මනස විකෘති වුණේ නෑ.

එහෙත් අද පෙර පාසලට ගිය විට ළමයට ඇසෙන්නේ අසාර්ථක වෙච්ච කෙනෙක් ගැන කියන අපට උරුම නැති දේවල් ය.

"ජැක් ඇන් ජිල් ...
හම්ටි ඩම්ටි සැට් ඔන්ද පුල් .....

මේවායින් කියවෙන්නේඅසාර්ථක වෙච්ච ළමයි ගැනයි. මේවා අපේකමට නොගැළපෙන දේවල්. අපිටම උරුම ගීත තිබියදී ඇයි අපි අපේ දරුවන්ට මනස දුබල කරන දේවල්ම

කියා දෙන්නේ. ළමයාට ඇසෙන නැටුම්, ගැයුම්, වැයුම්, මනස සංවර වන ඒවා විය යුතුයි. අද ඇහෙන බොහෝ ගීත සහ නාද රටා වැඩිහිටි-යන්ගේ පවා මනස අවුල්කරන ඒවායි.

"අපිට අනන්ත අවස්ථා සහ සම්පත් තියෙනවා. ඒ අතින් අපේ ළමයි හරිම වාසනාවන්තයි. දුප්-පත්ය, පොහොසත්ය කියා බේදයක් ඔවුනතර නෑ. අපේ අවටම විවිධ ගස්කොළන් තියෙනවා. අහස නොයෙක් නොයෙක් පාටින් පෙනෙනවා. පොළොවේ විවිධ මට්ටම් හැඩ තියෙනවා. කඳු වැටි, ගල්තලා උස් පහත්බිම් යනාදී වශයෙන් එළි-මහනේ ඉන්න පුළුවන් දේශගුණයක් තියෙනවා. විවිධ සතුන් කුරුල්ලො අපේ නිවසේ අවට ඉන්-නවා. නොයෙක් නොයෙක් පලතුරු වර්ග පලා වර්ග තියෙනවා. මේ සියලුම සම්පත් මේ තරමටම වෙනත් කිසිම රටක නෑ. ඒනිසා මේ අත්දැකීම් ලබාදෙන්න. ඒ ලබා දෙන අත්දැකීම් ගැන කතා කරන්නත් ඕනෙ.

"දරුවාට කතා කිරීමේ හැකියාව ලැබෙන විට ඒ ගැන දරුවා විස්තර අහනවා. මව්පියන් මේවාට පිළිතුරු දිය යුතුයි. ඉගෙන ගන්නවා කියන්නෙ ඒකටයි. ළමයාගේ මේරීමත් සමගම අවයව මෙහෙයවා ගන්නා විට ගැටළු ඇතිවෙනවා. ළම-යාට නගින්න ඕනෙ, බහින්න ඕනෙ, රිංගන්න ඕනෙ, පනින්න ඕනෙ, මිරි-කන්න ඕනෙ, මේ සේරම කරන්නෙ ඉගෙන ගන්න. මේවා කිරීමෙන් තමන්ම ගැටලු විසඳ ගන්නවා. එයින්ම ගැටලු විසඳ ගැනීමේ ශක්තිය ලැබෙ-නවා. මේ හැම දෙයක්ම කරන විට වැඩිහිටියො ඒවා වලක්වනවා. එසේ වැලැක්වීමෙන් වැඩිහිටියො කරන්නෙ ඉගෙනීමට විවෘත වෙච්ච මනස වසා දැමීමයි.

අත්දැකීම්වලින් පිරුණ මනස බුද්ධිමත්. ඒ නිසා ළමයින් මෝරන්න, මෝරන්න එයාලගෙ පංචේන්ද්‍රියයන් මෙහෙයවල අත්දැකීම් ලබනව. ඒවාට වැඩිහිටියො ඉඩදිය යුතුයි. යමක්දෙස බලා නිරීක්ෂණය පුරුදු වෙනවා. නිරීක්ෂණය පුරුදු වෙන ළමයා ස්වයං අධ්‍යයනයට පුරුදු වෙනවා. පසුකාලෙදි ළමයාගේ අධ්‍යාපනයට එය ලොකුම ප්‍රයෝජනයක් වෙනවා.

අත්දැකීම්වලින් පිරුණ මනස බුද්ධිමත්. ඒ නිසා ළමයින් මෝරන්න, මෝරන්න එයාලගෙ පංචේන්-ද්‍රියයන් මෙහෙයවල අත්දැකීම් ලබනව. ඒවාට වැඩිහිටියො ඉඩදිය යුතුයි. යමක්දෙස බලා නිරීක්ෂණය පුරුදු වෙනවා. නිරීක්ෂණය පුරුදු වෙන ළමයා ස්වයං අධ්‍යයනයට පුරුදු වෙනවා. පසුකාලෙදි ළමයාගේ අධ්‍යාපනයට එය ලොකුම ප්‍රයෝජනයක් වෙනවා.

"මේ අත්දැකීම් ලබන්න ලබන්න ළමයාගේ මේරීමට අනුව ගෙදර වැඩවලට සහභාගි කර-ගන්න ඕනෙ. ගෙදර කෙරෙන වැඩ ගැන දැනුමක් මෙන්ම හැඟුමක්, ඇති කර ගන්න, ගෙදර කරන වැඩ ගැන කියා දෙන්න ඕනෙ. එවිට ගෙදර කරන කතා බහ, විස්තර කරවන ප්‍රශ්න අහන සවන් දෙන හුරුව ලැබුණාම ඒ ඒ අවස්ථාවට උචිත භාෂාවට ළමයා ඉබේම හුරුවෙනවා.

"කෝප්පෙ වතුර පිරිලා."

"මුරුංගා දිගයි."

"බෝංචි කොටයි."

"විදුරුවෙ වතුර ටිකයි." යනුවෙන් ඇහෙන විට ගණිතමය භාෂාවක් ඉගෙන ගන්නවා. ගණිත සංකල්ප පිළිබඳ දැනුමක් ලැබෙනවා.

"මේසෙ උඩ තියෙන වීදුරුව."

"එක අතකට බෝල එකයි. අත් දෙකේම බෝල දෙකයි." මේවායින් මූලික ගණිත දැනුම ගෙදරින්ම ලබා ගන්නවා.


ළමයාට මේ හැම අත්දැකීමක්ම නැවත නැවත ලබාගන්න සලස්වන්න ඕනෙ. විවිධ අවස්ථාවලින් අත්දැකීම් ලබාගන්න, ඒවායින් ප්‍රයෝජන ගන්න ඉඩකඩ සලස්වන්න ඕනෙ. මළගෙදරට, තොවිල්-පළකට, පන්සලකට, පල්ලියකට ළමයා එක්ක ගියාම ඒවායේ විසිතුරු බලයි. ප්‍රශ්න අසයි. අත්දැ-කීම් එකතුකර ගනියි. ළමයට ඒවා විස්තර කර කියා දිය යුතුයි. පසුකාලෙකදි ළමයට පාසලෙදි රචනයක් ලියන්න වුණාම ඒ අත්දැකීම් නැවත නැවත මතක්කර ප්‍රයෝජනයට ගන්න පුළුවන්.

සෙල්ලම්බඩු ගෙනැත් ළමයාට නොදී ඒවා අල්-මාරියෙ, කඩබ් එකේ දලා තියන්න එපා. ඒවා පරි-හරණය කරන්න, ගල-වන්න, හදන්න ඉඩ දෙන්න ඕනෙ. එසේ කිරී-මෙන් ළමයා එයින් යමක් ඉගෙන ගනියි.

කතන්දර අහන්න ආසයි. එකම කතාව නැවත නැවත අහන්නත් ආසයි. ඒ කතාවෙ ළම-යගෙ සිත ගිය තැනක් ඇති. කුතුහලය නිසා ඒ තැන අහන්න ආසයි. ළම-යත් තමන් ඇසූ කතාවක් මතකයෙන් ටික ටික, එහෙන් මෙහෙන් කියාවි. වැඩිහිටියො ඒ කතාවෙ අඩු පාඩු පුරවා කියා දිය යුතුයි. ඒකත් ඉගෙනුමක්.

දරුවාට කෑම කවන විටත්, ඒ පිළිබඳව විස්තර කර කැවීමෙන් ළමයා යම්කිසි ඉගෙනුමක් ලබ-නවා. බොහෝ විට ළමයාටම තම අතින්ම බත් කන්න ඉඩ දිය යුතුයි. අතින් බත් කනවිට ඇඟිලි පහම ක්‍රියාත්මක වෙනවා. මැණික් කටුව හර-වන්න පුරුදු වෙනවා. "හ" යන්න "ග" යන්න ලියන්න අතහරවල ලියන්න ලෙහෙසියි. ගෙදරින් ලැබෙන මේ ඉගෙනුම මොන්ටිසෝරියෙන් ලැබෙන්නෙ නැහැ.

ළමයාට අවුරුදු තුන විතර වෙන විට, කඩපලට යද්දි එක්ක යායුතුයි. වෙළෙඳපොළේ තියෙන දේවල් එවිට ඉගෙන ගන්නවා. ආර්ථික දූර්වලකම්



ඇත්නම් ඒවත් කියා දිය යුතුයි. "පුතේ ඒව ගන්න අපිට සල්ලි මදි. හැමදේටම මධ්‍යම ප්‍රතිපදාව තිබිය යුතුයි. පමණට කෑම, ඇඳීම, නැටුම්, ගැයුම් වලට යාම. දරුවකුට වයස අවුරුදු තුනක්, තුනහමාරක් පමණ වූ විට පෙර පාසලකට යැවිය යුතුයි. පෙර-පාසල නිවත් මව්පියන් ඉන්න තැනක් හැටියට සළකන්න ඕනෙ. පෙර පාසලේදි දරුවා සම වයසේ දරුවන් හා හැසිරීමට ඉගෙන ගන්නවා. විධානවලට හුරුවීමට, නීති රීති පිළිපැදීමට ඉගෙන ගන්නවා. පෙර ලිවීමේ හුරුව, පෙර කිය-වීමේ හුරුව, ප්‍රශ්නවලට පිළිතුරු දීමේ හුරුව, නිවැරදි උච්චාරණය, යමක් නිරීක්ෂණය කිරීමේ හුරුව, තමන් පාලනය කර ගැනීමේ හුරුව, සුහද සම්බන්ධතා ඇතිකර ගැනීමේ හුරුව, සියුම් මාංශ පේශි හා දළ මාංශපේශි ක්‍රියාත්මක කිරීමේ ක්‍රියා-කාරකම්හි යෙදීම, නිදහසේ රඟපෑම, ක්‍රමානුකූලව ආහාර ගැනීමේ පුරුද්ද ඇති කිරීම, සමාජයට මිත්‍රවීමට, අන්‍යයන් හා කුළුපගවීමට හැඩගැස්වීම පෙර පාසල මඟින් කෙරෙන කාරියන් අතර වේ.

ළමයා පෙර පාසලේ ගතකරන අවුරුද්ද හෝ දෙක ළමයා විධිමත් පාසලකට යාමට සූදානම් කිරීමක් වේ. පැන්සලය නියම ලෙස ඇල්ලීමට සූදානම් කිරීම, පොත් ප්‍රවේශමෙන් අල්ලන ආකා-රය, පිටු පෙරලන ආකාරය කියාදීම, ගුරුවරියගේ කතාවට ඇහුන්කන් දීමට හුරුකිරීම, අණ පිළිපැ-දීමට දෙන ලද වැඩ කිරීමට හුරු කිරීම ද පෙර පාසලින් කෙරෙන කාරියන් අතර වේ.

මෙසේ උගෙනුමට සූදානම් කළ, ආශාව ඇතිකළ දරුවා විධිමත් පාසලකට ඇතුළුවීමට ගිය කළ එම දරුවාට එම අලුත් පාසලට හුරුවීමට පහසු-වෙනවා ඇත.

සාකච්ඡා කළේ
**චන්ද්‍රලතා සේනානායක**